**ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

-----------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.මිලියන 10 ක පිරිවැයකින් ඉදිකළ කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වල දක්වා නොතිබීමෙන් සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා නොතිබුණි. | සභාව සතු ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්වල ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතු වේ. | අදාල ලියවිලි අමාත්‍යාංශයෙන් ලබාගෙන අවසන් ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | 2019 වර්ෂයේ දී දැන්වීම් පුවරු 03 වෙනුවෙන් අයවිය යුතු ගාස්තු රු.127,500 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අයවිය යුතු ගාස්තු ගිණුම්ගත කළ යුතු වේ. | මෙම ගාස්තු අයකර ගැනීම සඳහා දිගටම අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

#### (ආ) විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති විම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 5,823,890 ක් වටිනා ගිණුම් විෂයන් 03 කට අදාල ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන සහ ශේෂ සනාථ කිරීමේ ලියවිලි යන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටු දායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂයන් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් ගොඩනැගිලි සහ ලී බඩු සටහන් කරන අතර, විස්තරාත්මක ලිඛිත සාක්ෂි සමන්තුරේ ප්‍රාදේශීය සභාවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්මවූ රු. 70,720 ක තැන්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | තැන්පත් අදාල අයට ගෙවීමට හෝ ආදායමට මාරුකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.857,490 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.341,092 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 60,000 | 16,970 | 16,970 | -- | 100,000 | 18,250 | 18,250 | -- |
| කුලී | 1,565,000 | 505,810 | 510,610 | 1,029,223 | 1,980,000 | 920,650 | 1,018,450 | 1,034,023 |
| බලපත්‍ර ගාස්තු | 805,000 | 906,450 | 906,450 | -- | 705,000 | 817,410 | 817,410 | -- |
| වෙනත් ආදායම් | 7,076,000 | 6,011,226 | 6,011,226 | -- | 6,021,000 | 3,930,944 | 3,930,944 | -- |
| | **9,506,000** | **7,440,456** | **7,445,256** | **1,029,223** | **8,806,000** | **5,687,254** | **5,785,054** | **1,034,023** |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං‍මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ කාරණා 05 ක් සඳහා අතුරු ව්‍යවස්ථාවලට අදාල යෝජනා විෂය භාර අමාත්‍යවරයාට අනුමැතියට යවා තිබුණද, 2019 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | නියම අතුරු ව්‍යවස්ථා මගින් අපගේ ක්‍රියාවන් ක්‍රියාත්මක කර ගෙන යන අතර, 2014 වර්ෂයේ කාරණා 05 ක් යටතේ අතුරු ව්‍යවස්ථා සකස්කර ඒවා නීතියානුකූල කිරීම සඳහා ගැසට් කිරීමට නැගෙනහිර පළාත් නීති අංශ වෙත යවා තිබුණද, ඒවා ගැසට් කර නොතිබුණි. තවද, 2019 වර්ෂයේ නැවත අතුරු ව්‍යවස්ථා සකස්කර අනුමැතිය සඳහා යවා ඇත. |

**(ආ) ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ (PSDG) රු.මිලියන 01 ක කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රයක් ලබා දී තිබුණි. ඒ සඳහා විදුලි පහසුකම් නොමැති වීම නිසා නිෂ්ක්‍රියව පවතුනි. | පොහොර ඇඹරීම යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | යන්ත්‍රය ක්‍රියාකිරීම සඳහා 3 Phase Line විදුලි සම්බන්ධතාවයක් අවශ්‍ය වේ. විදුලි බල මණ්ඩල සමඟ සාකච්ඡා කර 3 Phase Line ලබා ගැනීමට කටයුතු කරමින් පවති. |

**(ඇ) පරිසර ගැටළු**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2015 වර්ෂයේ රු.1,338,328 ක පිරිවැයෙන් ඉදිකර තිබූ සෝ සාතකාගාරයට යාබදව සුසාන භූමියක් තිබීම හේතුවෙන් මහජන විරෝධතා පැන නැගීම නිසා ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. | අදාල අරමුණ සඳහා හෝ වෙනත් කටයුතු සඳහා ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | සාතාගාරය ඉදි කිරීමට වෙනත් ස්ථානයක් නොමැති වීම හේතුවෙන් ඉකුත් සභාව විසින් සභා තීරණයකින් සාතකාගාරයක් ඉදිකළද, දැනට එම ස්ථානයට නොදුරුව සුසාන භූමියක් තිබෙන බැවින් විරෝධතාවයන් මතුවී තිබුණි. ඒ අනුව මෙම ස්ථානයේ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කිරීමට තීරණය කර ඇත. |

**(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයක්ම ක්‍රියා කළ යුතු වුවත්, මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ළඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ළඟාකර ගැනීමට හා මැණීමට දර්ශක සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2015 – 2030 දක්වා ලබා ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් සම්බන්ධයෙන් අපගේ ප්‍රාදේශීය සභා විසින් අවධානය යොමු කර එක්එක් සංවර්ධන ව්‍යාපෘති සඳහා යෝජනා යොමු කරමින් පවති. තවද, මෙහි එක් කොටසක් වශයෙන් මහජන සහභාගිත්වයෙන් අයවැය පිළියෙල කර තිබුණි. වාර්ෂිකව පාසල් පිරිසිදු කිරීම, රොහල් වලට අවශ්‍ය සනීපාරක්ෂක කටයුතු සඳහා සහායදිම, යහපත් යටිතල පහසුකම් ලබා දීම යන කරුණු මේ යටතේ කරමින් පවති. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සඳහා අයකර වර්ග 14 ක ව්‍යාපාර ස්ථානවලින් ලැබිය යුතු රු.67,600 ක් අයකර ගෙන නොතිබුණි. | වෙළඳ මධ්‍යස්ථානවලින් අදාල ගාස්තු මුදල් වර්ෂයතුලම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදායම් පරීක්ෂක පුරප්පාඩු වෙනුවට, සේවකයකු තාවකාලික වශයෙන් පත්වූ ඇතත්, එම සේවකයා පරීක්ෂාකරන අවස්ථාවේදි මෙම වෙළඳ ස්ථාන දිගටම වසා තිබූ හේතුවෙන් අයකර ගැනීමට නොහැනීමට වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා කාර්යාලය, මහජන පුස්තකාලය, මහජන පොළ, මහජන ක්‍රිඩාංගනය සහ සෝ සාතකාගාරය යන ස්ථාන පිහිටුවා ඇති ඉඩම්වල ඔප්පු සභාවේ නමට පවරා ගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් ගොඩනැගිලි අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කර ඇත. |
| (ඇ) | 2019 වර්ෂයට එළිමහන් වෙළඳ පොළ බදු දීම සඳහා 02 වන මිල ගණන් කැඳවීමේ දී රු.253,000 ක් සහ රු.250,000 ක් වශයෙන් මිල ගණන් ලැබී තිබී ටෙන්ඩර් තැන්පත් සමඟ රු.253,000 ට ලබා දීමට තීරණය කර තිබුණි. අදාල පුද්ගලයා ටෙන්ඩරය භාරගෙන නොතිබුණද, ඔහුගේ රු.10,000 ක් වූ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවා තිබුණි. තවද, දෙවන ටෙන්ඩරය රු.250,000 ට ලබා නොදී, 03 වැනි වතාවට ටෙන්ඩර් කැඳවා රු.162,500 ට ගිවිසුම් ගතවී තිබුණි. ඒ අනුව සභාවට රු.87,500 ක ආදායමක් අහිමිවී තිබුණි. | ටෙන්ඩර් කොන්දේසි කඩකරන අයගේ ටෙන්ඩර් තැන්පත් සභා ආදායමට ගත යුතු අතර, ඊළඟ වැඩිම මුදලට ගිවිසුම් ගතවිය යුතු වේ. | පවුල් පසුබිම සම්බන්ධයෙන් අවධානය යොමු කර තැන්පත් මුදල ආපසු ගෙවන ලදි. තුන්වැනි වරටත් ටෙන්ඩර් කැඳවන ලදි. අදාල කාලය තුල කිසිවෙකු ඉදිරිපත්වී නොතිබුණද, කලින් අයදුම් කළ අයම ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනිමට ඉල්ලුම් කළ අවස්ථාවේ සභාපති විසින් ඒ දෙදෙනා සමඟ සාකච්ඡා කර අලුතින් අයදුම්පත් ගාස්තු රු.2,500 ක් අයකර අයදුම්පත් ලබා දෙන ලදුව එක් අයෙක් පමණක් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු නිසා එම පුද්ගලයට ටෙන්ඩරය පිරිනමන ලදී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 05 ක පුරප්පාඩු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි. තවද, ආදායම් පරික්ෂක තනතුර 2014 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් පරික්ෂක පුරප්පාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානි සහ අමාත්‍යාංශ ලේකම් වෙත කිහිප වතාවක් දැනුවත් කර ඇතත් මෙතෙක් පිරවීමට කටයුතු කර නැත. 2020 වර්ෂයේ මෙම පුරප්පාඩු පුරවන බව අමාත්‍යාංශ ලේකම් දැනුම් දී ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් රු.52,577,947 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, ස්ථාවර වත්කම් ලේඛනවල සටහන් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර ගිණුම්වල හෙළිදරව් කළ යුතු වේ. | අප සභාව සමන්තුරේ ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලයක් වශයෙන් තිබී වෙනමම ප්‍රාදේශීය සභාවක් වශයෙන් වෙන්කළ අවස්ථාවේදි වත්කම් හා බැරකම් භාර දීමේදී අවසන් ගිණුම්වල පෙන්වා තිබුණද, ඒ සම්බන්ධ ලියවිලි කිසිවත් භාරදී නොතිබුණි. |

### 3.4.2 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 12 ක් මහජන පොළ භූමියේ නිසි ආරක්ෂාවකින් තොරව ගාල් කර තිබුණි. | සභාවේ වාහන ආරක්ෂා කිරීම සඳහා විධිමත් වාහන අංගන පහසුකම් ඇතිකිරීමට කටයුතු කළ යුතු වේ. | නොයෙකුත් උත්සාහයෙන් පසු 2020 වර්ෂය සඳහා PSDG ව්‍යාපෘති යටතේ ළමා උද්‍යානයක් අසල මෙම වාහන අංගනය ඉදිකිරීමට යෝජනා යවා ඇති අතර, ඉදිරියේදි මෙම ප්‍රශ්නය විසඳීමට හැකිය. |

### 3.4.3 නිෂ්ක්‍රිය වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | UNDP වැඩ සටහන් යටතේ රු. මිලියන 4.975 ක් වියදමින් 2017 වර්ෂයේ ඉදිකරන ලද මහජන පොළ ගොඩනැගිල්ලේ උඩු මහල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මහජන පොළ ගොඩනැගිල්ලේ උඩු මහල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 PSDG ව්‍යාපෘති යටතේ මෙම ගොඩනැගිල්ල වෙනස්කම් කීපයක් කර බදු දීමට යෝජනා කර ඇත. |
| (ආ) | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ සංවර්ධන අරමුදල් වැඩ සටහන් යටතේ රුපියල් මිලියන 4,690 ක් වැයකර 2018 වර්ෂයේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණය අදාල අරමුණ සඳහා යොදවාගෙන නොතිබුණි. | අදාල ගොඩනැගිලි වෙළඳ සංකීර්ණය බදු දීමට කටයුතු කළ යුතු වේ. | මෙම වෙළඳ සංකීර්ණය බදු දීමට නොයෙකුත් බැංකු සමඟ සාකච්ඡා කළ ද, මහජන බැංකුව තම ශාඛාව මාරු කිරීමට කැමැත්ත දක්වා ඇත. අනෙකුත් අය ඉතා අඩු මිළ ගණන්වලට ඉල්ලීම නිසා ලබා දී නොතිබුණි. |

## 3.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

### 3.5.1 LED විදුලි බුබුළු මිලදී ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී මිල ගණන් කැඳවා එකක් රු.16,500 ක් බැගින් 150W LED විදුලි බුබුළු 42 ක් මිලදී ගෙන තිබුණු අතර, විදුලි බුබුළු 06 ක් වට්ටම් වශයෙන් ලැබී තිබුණි. මේ සඳහා රු.693,000 ක් වැය කර තිබුණි. කෙසේවෙතත් මෙවැනිම විදුලි බුබුළු කරෙයිතිවු ප්‍රාදේශීය සභාව විසින් එකක් රු.9,600 බැගින් මිලදී ගෙන තිබීම නිසා රු.190,800 ක මුදලක් අරපිරිමැසුම් රහිත ගෙවීමක් සිදුකර තිබුණි. | අදාල මිල වෙනස්කම් සම්බන්ධයෙන් අවධානය යොමු කර සාදාරන මිලකට භාණ්ඩ මිලදී ගැනීම් සිදුවන බව තහවුරු විය යුතු වේ. | LED 150 W වර්ගයේ විදුලි බුබුළු වෙළඳ පොළේ නොයකුත් මිල ගණන්වලට ලබා ගැනීමට හැකිව තිබුණි. සභාපති සහ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීම් පරිදි තත්වයන් උසස් වර්ගයේ විදුලි බුබුළු මිලදි ගන්නා ලදි. මේ පමණක් නොව මෙම LED Light සම්බන්ධයෙන් සවිකිරීම් සඳහා අවශ්‍ය යකඩ පට Handle, Wire ඇතුළුව මිල ගණන් ලහා ගෙන වර්ෂ 02 වගකීම සිහිතව මිලදී ගෙන තිබුණි. |